# පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහය

## 1.0 පාසල් ව්‍යුහ කටයුතු

1981 දෙසැම්බර් මස 07 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද "පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහය" කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. පසුගිය කාලය තුළ පාසල් පද්ධතියෙහි හා අධ්‍යාපන පරිපාලන ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම්වලට අනුකූලව එය නැවත සංශෝධනය කර ඇත.

සමස්ථ දිවයිනෙහි ම පාසල් ව්‍යුහ කටයුතු ක්‍රියාත්මක වන ආකාරය සමාන විය යුතු බැවින් මෙම උපදෙස් අනුව කටයුතු කරන මෙන් පළාත් අධ්‍යාපන ලේකම්වරුන් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත කාරුණිකව දන්වමි.

### 1.1 හැඳින්වීම

පාසල් ව්‍යුහ කටයුතු ලෙස සලකනුයේ පහත සඳහන් ක්‍රියාකාරකම් ය.

- i. නව පාසල් ආරම්භ කිරීම.
- ii නව පන්ති හෝ අධ්‍යාපන චක්‍ර ආරම්භ කිරීම
- iii පාසල් ප්‍රතිව්‍යුහගත කිරීම.
- iv පාසල් උසස් කිරීම
- v පාසල්වල ස්ථානීය වෙනස්කම්.
- vi පාසල්වල නම් වෙනස් කිරීම.
- vii ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කාර්යයන්.

### 1.2 පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ කමිටුව ස්ථාපනය කිරීම.

පාසල් ව්‍යුහ කටයුතු මැනවින් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අමාත්‍යාංශ මට්ටමින්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මට්ටමෙන් සහ කලාප මට්ටමින් කමිටු පිහිටුවිය යුතු ය.

### 1.3 ජාතික පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ කමිටුව

රජයේ අමාත්‍යාංශයේ පිහිටුවන ලද පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ කමිටුව මඟින් ජාතික පාසල්වල ව්‍යුහ කටයුතු ඉටු කළ යුතුය.

එම කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

- i අතිරේක ලේකම්, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන.
- ii අතිරේක ලේකම්, අධ්‍යාපන සංවර්ධන
- iii අධ්‍යක්ෂ, සැලසුම් හා කාර්යසාධන සමාලෝචන
- iv අධ්‍යක්ෂ, ජාතික පාසල්
- v අධ්‍යක්ෂ, පාසල් කටයුතු
- vi අධ්‍යක්ෂ, දත්ත කළමනාකරණ හා පර්යේෂණ
- vii ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු

### 1.4 ජාතික පාසල් ව්‍යුහ කටයුතු කමිටුවේ කාර්යයන්

එම කමිටුව අවශ්‍ය පරිදි රැස්වී ජාතික පාසල්වලට අදාළ පහත සඳහන් කරුණු පිළිබඳව සාකච්ඡා කොට තීරණ ගත යුතුය.

- i නව ජාතික පාසල් ආරම්භ කිරීම.
- ii පළාත් පාසලක් ජාතික පාසලක් බවට පරිවර්තනය කිරීම.
- iii පළාත් පාසලක් ජාතික පාසලක් සමඟ ඒකාබද්ධ කිරීම.
- iv ජාතික පාසලක නම වෙනස් කිරීම.
- v ජාතික පාසලක නව පන්ති හා අධ්‍යාපන චක්‍ර ආරම්භ කිරීම හෝ ඉවත් කිරීම.
- vi ජාතික පාසලක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කටයුතු

**1.5 පළාත් පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ කමිටු**

සෑම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවක ම පාසල් ව්‍යුහ කටයුතු කමිටුවක් පිහිටුවීම අත්‍යා
වේ. මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

i පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ – සභාපති

ii නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සැලසුම් - ලේකම්.

iii නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/අධ්‍යාපන සංවර්ධන - සාමාජික

**1.6 පළාත් පාසල් ව්‍යුහ කටයුතු කමිටුවේ කාර්යයන්**

පාසල් ව්‍යුහ කටයුතුවලට අයත් වන පහත සඳහන් කාර්යයන් පිළිබඳ යෝජනා සහ සැලසු
කමිටුව විසින් සකස් කොට අදාළ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කො
අනුමැතිය ලබා ගත යුතු ය.

i නව පාසල් ආරම්භ කිරීම.

ii පාසල්වල තත්ත්වය ඉහළ දැමීම.

iii පළාත් පාසලක් ජාතික පාසලක් හා ඒකාබද්ධ කිරීම.

iv පළාත් පාසලක් තවත් පළාත් පාසලක් සමඟ ඒකාබද්ධ කිරීම.

v නව පන්ති හෝ අධ්‍යාපන චක්‍ර ආරම්භ කිරීම.

vi පාසලක අධ්‍යාපන චක්‍ර ඉවත් කිරීම.

vii පාසල් වැසීම

viii පාසලක නම වෙනස් කිරීම.

ix පාසල්වල ස්ථානීය වෙනස්කම්.

x ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කටයුතු

**1.7 කලාප මට්ටමේ ව්‍යුහ කටයුතු කමිටු**

සෑම කලාප කාර්යාලයක ම කලාප මට්ටමේ ව්‍යුහ කටයුතු කමිටු පිහිටුවිය යුතු ය. මෙම
පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුක්තයි.

| | | | |
|---|---|---|---|
| i | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ. | - | සභාපති |
| ii | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සැලසුම් | - | ලේකම් |
| iii | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ සංවර්ධන | - | සාමාජික |

**1.8 කලාප පාසල් ව්‍යුහ කටයුතු කමිටුවේ කාර්යයන්**

කලාපයේ පාසල් ව්‍යුහ කටයුතුවලට අයත් වන පහත සඳහන් කාර්යන් පිළිබඳ යෝජනා හා
මෙම කමිටුව විසින් සකස් කොට අදාළ නිර්දේශ සමඟ පළාත් ව්‍යුහ කමිටුව වෙත ඉදිරිප
යුතුය.

i නව පාසල් ආරම්භ කිරීම.

ii පාසල්වල තත්ත්වය ඉහළ දැමීම

iii පාසල්වල නව ශ්‍රේණි ආරම්භ කිරීම.

iv පාසල්වල ශ්‍රේණි ප්‍රමාණය අඩු කිරීම.

v පාසලක් තවත් පාසලක් සමඟ ඒකාබද්ධ කිරීම.

vi පාසල් වැසීම.

vii පාසලක නම වෙනස් කිරීම.

viii පාසල්වල ස්ථානීය වෙනස්කම්.

ix පාසලක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කටයුතු

## 2.0 නව පාසලක් ආරම්භ කිරීම

### 2.1 නව පාසලක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය

නව පාසලක් ආරම්භ කිරීම සඳහා නිර්දේශය ලබා දිය යුත්තේ ඒ සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවක පමණි. පහත සඳහන් අවස්ථාවන්හි දී නව පාසලක් විවෘත කිරීමේ අවශ්‍යතාවය මතු විය හැකිය.

(අ) ප්‍රදේශය තුළ සිටින වයස අවුරුදු 10 ට අඩු ළමුන්හට කි.මී. 2 ට වැඩි දුරක් ගෙවා ප්‍රාථමික පාසලකට යාමට සිදු වන අවස්ථාව

(ආ) ප්‍රදේශය තුළ සිටින 6 – 11 පන්තිවල අධ්‍යාපනය ලබන සිසුන්ට කි.මී. 4 කට වැඩි දුරක් ද්විතීයික පාසලකට යාමට සිදු වන අවස්ථාව

(ඇ) ඉහත සඳහන් පරිදි නියමිත දුර ප්‍රමාණයෙහි ප්‍රාථමික හා ද්විතීයික පාසල් පැවතිය ද පහත සඳහන් අවස්ථාවන්හි දී නව පාසලක් ආරම්භ කළ හැකිය.

i පවත්නා පාසල්වල ඇති ඉඩකඩ ප්‍රමාණයට වඩා වැඩි පාසල් යා යුතු වයසේ පසු වන ශිෂ්‍ය ජනගහණයක් අදාළ ප්‍රදේශය තුළ වාසය කිරීම. (ජන හා සංගණන වාර්තා මඟින් ඔප්පු කළ යුතුය)

ii නියමිත දුර ප්‍රමාණයෙහි පාසල් පැවතිය ද වනාන්තර, ගංගා පිහිටීම, කඳුවැටි වැනි ස්වභාවික බාධක නිසා එම පාසල් කරා ළඟා වීම අපහසු වීම.

(ඈ) මහවැලි ව්‍යාපෘතිය වැනි නව ජනාවාස හෝ ගොවි ජනපද හෝ ආදර්ශ ගම්මාන ආරම්භ කිරීමේ දී ප්‍රදේශයේ පදිංචියට පැමිණෙන පවුල් සංඛ්‍යාවේ පාසල් යා යුතු වයසේ පසු වන ශිෂ්‍ය සංඛ්‍යාව හා එහි වර්ධනය සලකා බලා නව පාසල් ආරම්භ කළ හැකිය.

(ඉ) නව පාසලක් ආරම්භ කිරීමේ යෝජනා පහත සඳහන් පරිදි දෙයාකාරයකින් ඉදිරිපත් විය හැකිය.

i කලාප අධ්‍යාපන කාර්යාලයෙහි සැලසුම් අංශය මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව

ii ප්‍රදේශයේ දෙමාපියන්, ග්‍රාම නිලධාරීන් හෝ වෙනත් බාහිර සංවිධානයක් මඟින් ඉදිරිපත් කරන යෝජනාවක් අනුව

එසේ යෝජනා ඉදිරිපත් වූ විට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අදාළ දත්ත හා සංඛ්‍යා ලේඛන සලකා බලා යෝජනාව පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු ය.

- අදාළ පෝෂක ප්‍රදේශය තුළ එම වර්ගයේ පාසලක් නොමැතිවීම.
- අදාළ පෝෂක ප්‍රදේශය තුළ නව පාසලක් ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් තරම් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටීම.
- අදාළ පෝෂක ප්‍රදේශය තුළ ඇති පාසලෙහි/පාසල්වල නියමිත අධ්‍යාපන තලයේ සියලු දරුවන් සඳහා ඉඩකඩ නොමැති වීම.
- නව පාසලක් ඉදිකිරීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් ගොඩනැඟිලි සඳහා භූමියක් පැවතීම.

**සටහන**

යම් ප්‍රදේශයක ශිෂ්‍ය සංඛ්‍යාව නව පාසලක් ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ නම් එම සිසුන්ට අධ්‍යාපනය ලබා දීමට විකල්ප ක්‍රියාමාර්ග ගැනීම අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ. මේ සඳහා ප්‍රදේශය තුළ මූලික අධ්‍යාපනය ලබා දෙන ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හෝ සිසුන්ට ප්‍රදේශයෙන් පිටත පාසලක අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය මූල්‍යාධාර ලබා දීම වැනි ක්‍රියාමාර්ගයක් ගත හැකිය.

## 22 නව පාසලක් ආරම්භ කිරීමේ ක්‍රියා පිළිවෙළ :-

(අ) නව පාසලක් ආරම්භ කිරීමට ඉදිරිපත් වී ඇති යෝජනා පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සෑහීමකට පත් වන්නේනම් ඒ පිළිබඳව සාධාරණීකරණය කරමින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එම යෝජනාව ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා පාසල් ව්‍යූහ කටයුතු පිළිබඳ කමිටුව විසින් ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට අනුව අවශ්‍ය භෞතික හා මානව සම්පත් සහ අවශ්‍ය අනෙකුත් සාධක සලකා බලමින් පාසල පිහිටුවිය යුතු ස්ථානය තීරණය කළ යුතුය. එම කමිටුව විසින්, ප්‍රදේශයේ පාසල් ය යුතු වයසේ ශිෂ්‍ය ජනගහනය දැනට පවතින පාසල්වලට ඇතුළත් කිරීමට නොහැකි වීමට සාධාරණ හේතු තිබේදැයි පරීක්ෂා කර බලා ලිඛිත වාර්තාවක් සකස් කළ යුතුය. සාධාරණීකරණය කළ නොහැකි හේතු පවතී නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නව පාසලක් ආරම්භ කිරීමේ යෝජනා නිර්දේශ නොකළ යුතුය.

(ආ) එම යෝජනාව සාධාරණීකරණය කළ පසු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නව පාසල ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් තිබේ ද යන්න පිළිබඳව සෑහීමකට පත්විය යුතුය. ප්‍රාථමික පාසලක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් අක්කර දෙකක භූමි ප්‍රමාණයක් අවශ්‍ය වේ. එසේ අවශ්‍ය ප්‍රමාණයෙ ඉඩමක් තිබේ නම්, එය රජයේ ඉඩමක් නම්, එහි පාසල ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම කටයුතු කළ යුතුය. අදාළ ග්‍රාම නිලධාරින් හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත් ලිපි ලේ සඳහා අවශ්‍ය වේ. මෙම ඉඩම පෞද්ගලික ඉඩමක් හෝ වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතනයකට අයත් නම් එම ඉඩම මිලදී ගැනීම සඳහා පළාත් සභාවට ප්‍රමාණවත් මුදල් තිබේ ද යන්න නිශ්චිත දැන ගත යුතුය. ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ පවත්නා නීති රෙගුලාසි සහ ඒ සඳහා ගත වන කාලය පිළිබඳ පළාත් අධ්‍යපන අධ්‍යක්ෂක විසින් සලකා බලා නව පාසල සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමට කල් වේලා ඇතිව පියවර ගත යුතුය.

(ඇ) නව පාසල සඳහා තෝරා ගත් ඉඩමෙහි යෝග්‍යතාවය පිළිබඳව, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසි නියමිත ආකෘතියෙහි අදාළ කොටුවල සුදුසු සටහන් පැහැදිලිව යෙදිය යුතුය.

(ඈ) නව පාසල ආරම්භ කිරීම සඳහා සුදුසු ගොඩනැගිලි පවතින බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සෑහීම පත් විය යුතුයි. ගොඩනැගිලි නොමැති නම් සුදුසු ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කටයුතු කළ යුතුය.

(ඉ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මුදල් කවර මාර්ගයකින් ලැබේදැයි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසි ප්‍රකාශ කළ යුතුය. එය පළාත් සභා අරමුදල්වලින් හෝ වෙනත් ආකාරයකින් හෝ ලැබේ ද යන් සඳහන් කිරීම අවශ්‍ය වේ. අනුමත සහ ලැබෙන මුදල් ප්‍රමාණය පිළිබඳ සහතික කරන ලද ලිපියක මුදල් ලබා දෙන ආයතනයෙන් හෝ පුද්ගලයන්ගෙන් ලබා ගෙන එය (ආර්. 02) ආකෘතිය සමඟ ය කළ යුතුය

(ඊ) පාසල් ගොඩනැගිලි ඉදිකර ඇත්තේ ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ වෙනත් ස්වෙච්ඡා සංවිධානයකි නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම ගොඩනැගිල්ල ළමුන් සඳහා ආරක්ෂා සහිත බවට සෑහීම පත්විය යුතු අතර එම ගොඩනැගිල්ල පවරා ගෙන පාසලක් පවත්වා ගෙන යාමට සුදුසු බවට පළා ගොඩැනැගිලි අධ්‍යක්ෂගෙන් ලිඛිත සහතිකයක් ලබා ගත යුතුය.

(උ) යම් ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ වෙනත් ස්වේච්ඡා සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලබ පාසලක් පවරා ගැනීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත බලය පැවරූ අවස්ථාවක දී එබ පාසලක් පවරා ගත යුත්තේ කාර්ය මණ්ඩලය නොමැතිවයි.

(ඌ) පාසල සඳහා අවශ්‍යවන අධ්‍යයන කාර්ය මණ්ඩලය තම පළාත තුළින් ම සම්පූර්ණ කර ගැනී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීමයි.

(එ) එලෙස ම පාසල සඳහා අවශ්‍ය ලී බඩු හා උපකරණ සම්පූර්ණ කර ගැනීමේ වගකීම ද පළා අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වනු ඇත.

(ඒ) ඉහත කරුණු සලකා බැලීමෙන් පසුව එම පාසල ආරම්භ කිරීමේ යෝජනාව සඳහා පළාත් අධ්‍යාප ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

## 2.3 පොදු කරුණු

(අ) නව පාසල ආරම්භ කළ පසුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පාසල ආරම්භ කිරීම පිළිබඳ දැන්වි යුතුය. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට හා රේඛීය අමාත්‍යාංශය ඇතුළු සෙසු අදාළ ආයතනවල අවශ්‍ය තරම් පිටපත් යැවිය යුතුය.

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පළාත් අධ්‍යාපන ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව කිසිදු න පාසලක් ආරම්භ කළ නොහැකිය.

(ඇ) නව පාසලක් ඉදිකිරීම සඳහා පවරා ගත් ඉඩමක පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියකින් තොර කිසිදු ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතුය. ඒ සඳහා ආර්.2 ආකෘතිය මඟින් අනුමැතිය ලබා ග යුතුය.

## 3.0. පාසල් ප්‍රතිව්‍යුහගත කිරීම / විචාරමත් කිරීම

### 3.1 පාසල් ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව

පාසලක් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණ වන්නේ මූල්‍ය හා මානව සම්පත් අපතේ යාම වළක්වා අධ්‍යාපනයෙහි යෙදවුම් හා නිමැවුම්වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමයි. භෞතික හා මානව සම්පත් විධිමත් අයුරින් පාසල් අතර බෙදී යාමට සැලැස්වීම මඟින් මෙම තත්ත්වය ඇති කිරීමට අපේක්ෂා කෙරේ. එකිනෙකට ආසන්නව පිහිටා ඇති පාසල්වල පවත්නා භෞතික හා මානව සම්පත් සලකා බලා අවශ්‍යතා අනුව සැලසුම්ගතව ප්‍රතිව්‍යුහගත කළ හැකිය. පාසල් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ යෝජනා කලාප හා පළාත් පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ කමිටු විසින් නිර්දේශ කොට පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

### 3.2 පාසල් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රම :-

3.2.1 පාසල් ඒකාබද්ධ කිරීම.
3.2.2 අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පාසල් වෙන් කිරීම
3.2.3 ප්‍රාථමික චක්‍ර නොමැති පාසල්වල අවශ්‍යතාවය අනුව ඒවා ආරම්භ කිරීම.
3.2.4 ශ්‍රේණි සංඛ්‍යාව අඩු කිරීම.
3.2.5 පාසලක නව ශ්‍රේණි ආරම්භ කිරීම.
3.2.6 පාසල් වැසීම.

සෑම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ම සිදු විය යුත්තේ පාසල් යා යුතු වයසේ පසු වන දරුවන්ට පාසල් පහසුකම් සැපයීමේ ප්‍රතිමානයන්ට අනුකූලවය.

එනම්:-

i වයස අවුරුදු 5 – 9 අතර වයස් කාණ්ඩයේ සෑම දරුවකුට ම තමා පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් දෙකක් ඇතුළත ප්‍රාථමික පාසලක අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව පැවැතිය යුතුය.

ii වයස අවු 10 – 16 අතර වයසේ සෑම සිසුවකුට ම තමා පදිංචි ස්ථානයේ සිට කි.මී. හතරක් ඇතුළත ද්විතියික අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව පැවැතිය යුතුය.

iii ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය හදාරන සෑම සිසුවකුට ම තමා පදිංචි ස්ථානයේ සිට කි.මී. 8 ක් ඇතුළත අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව පැවතිය යුතුය.

### 3.2.1 පාසල් ඒකාබද්ධ කිරීම.

යම්කිසි ප්‍රාථමික පාසලක එක් පන්තියක සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 10 ක් හෝ ඊට වඩා අඩු නම් (පැමිණීමේ ලේඛණයට අනුව) එම සිසුන් සියලු දෙනා ම පදිංචි ස්ථානවල සිට කි.මී. දෙකක් ඇතුළත වෙනත් ප්‍රාථමික පාසලක් හෝ ප්‍රාථමික අංශය සහිත පාසලක් පවතී නම් ඉහත සඳහන් පාසල එම පාසල සමඟ ඒකාබද්ධ කළ යුතුය.

**සටහන:** ඒකාබද්ධ කරනු ලැබූ පාසල වැසී යන බැවින් එහි ගොඩනැගිලි තුන් මසක් ඇතුළත වෙනත් අධ්‍යාපනික කාර්යයක් සඳහා යෙදවීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය. උදා:- ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන, නොවිධිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන.

### 3.2.2 අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පාසල් වෙන් කිරීම.

- ප්‍රාථමික අංශය සහිත ද්විතිය විද්‍යාලයක ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 500 ට වඩා වැඩි නම් එහි ප්‍රාථමික අංශය වෙන ම පාසලක් බවට පත් කර පරිපාලනය සඳහා වෙනත් විදුහල්පතිවරයකු පත් කළ යුතුය.

- ද්විතිය විද්‍යාලයක කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශවල ශිෂ්‍ය සංඛ්‍යාව 3000 ට වැඩි නම් එම පාසල් කනිෂ්ඨ (6 - 9) හා ද්විතියික (10 - 13) අංශ ලෙස වෙන් කොට පරිපාලනය සඳහා වෙන ම විදුහල්පතිවරුන් පත් කළ යුතුය.

**3.2.3 ප්‍රාථමික චක්‍ර නොමැති පාසල්වල ඒවා ආරම්භ කිරීම.**

ප්‍රාථමික චක්‍ර නොමැති ද්විතියික අංශය පමණක් පවතින පාසලක ප්‍රාථමික අංශය සඳහ ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටිත් නම් හා අදාළ පෝෂිත ප්‍රදේශය තුළ වෙනත් ප්‍රාථමි පාසලක් නොමැති නම් එම පාසලේ ප්‍රාථමික චක්‍රය ආරම්භ කළ හැකිය.

**3.2.4 ශ්‍රේණි සංඛ්‍යාව අඩු කිරීම**

1-6, 1-7, 1-8, හෝ 1-9 පන්ති සහිත පාසල්වල එක් එක් පංතිවල (නාම ලේඛනය අනුව ශිෂ්‍ය සංඛ්‍යාවේ සාමාන්‍යය 15 ක් හෝ ඊට වඩා අඩු නම් එහි 6-9 පන්ති ඉවත් කර එ ශිෂ්‍ය සංඛ්‍යාව වෙනත් පාසලකට හෝ පාසල්වලට යොමු කළ යුතුය. එසේ ඒකාබද්ධ කළ යු වන්නේ එම සියුන් පදිංචි ස්ථානවල සිට කි.මී.4 ක් දුරින් එම වර්ගයේ වෙනත් පාසලක් පවත් නම් පමණි.

1-11 පන්ති සහිත පාසල්වල 10-11 ශ්‍රේණිවල එක් එක් පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව 15 හෝ ඊ වඩා අඩු නම් (නාම ලේඛණය අනුව) එහි 10 -11 පන්ති ඉවත් කර එම ශිෂ්‍ය සංඛ්‍යා වෙනත් පාසලකට හෝ පාසල්වලට යොමු කළ යුතුය. එසේ ඒකාබද්ධ කළ යුතු වන්නේ සියුන් පදිංචි ස්ථානවල සිට කි.මී.4 ක් දුරින් එම වර්ගයේ වෙනත් පාසලක් පවතී නම් පමණි.

12–13 ශ්‍රේණි පවතින පාසල්වල ඒ ඒ විෂය ධාරාවට අයත් ශිෂ්‍ය සංඛ්‍යාව 12 හෝ ඊට වඩ අඩුනම් (නාමලේඛණය අනුව) එහි 12-13 ශ්‍රේණි ඉවත් කර එම ශිෂ්‍ය සංඛ්‍යාව වෙනත් පාසලකට හෝ පාසල්වලට යොමු කළ යුතුය. එසේ ඒකාබද්ධ කළ යුතු වන්නේ සියුන් පදිංචි ස්ථානවල සිට කි.මී.8 ක් දුරින් වෙනත් එම වර්ගයේ පාසලක් පවතී නම් පමණි.

**සටහන :-** ඉහත සඳහන් කවර පියවරක් වුව ද ගත යුත්තේ පාසල් පහසුකම් සැපයීමේ අනිවාර්ය දුර පිළිබඳ විධිවිධානයන්ට අනුකූලවය.

**3.2.5 නව ශ්‍රේණි ආරම්භ කිරීම.**

නව ශ්‍රේණි ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ අවශ්‍යතාවය පවතින පාසල්වල නව ශ්‍රේණි ආරම්භ කිරීම පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය සහිතව සිදු කළ හැකිය.

**ශ්‍රේණි වර්ගය**

- ❖ ද්විතීයික ශ්‍රේණි ආරම්භ කිරීම (6 – 11)
- ❖ අ.පො.ස. (උ.පෙළ) කලා, වාණිජ, විද්‍යා කෘෂිකර්මය, ගෘහ විද්‍යා හා සෞන්දර්යය විෂයයන් ආරම්භ කිරීම.

පාසලක 6-11 දක්වා ශ්‍රේණි වැඩි කිරීමේ දී සැමවිට ම සමාන්තර පන්ති සංඛ්‍යාව සමානව තබා ගැනීමට කටයුතු කළ යුතුය.

**(අ) ද්විතියික ශ්‍රේණි ආරම්භ කිරීම.**

i. යම් පාසලක 6 වැනි ශ්‍රේණිය පැවැත්වීම සඳහා අනුමැතිය ලැබ ඇතත් ඒ ළඟ වර්ෂයේ දී 7 වැනි ශ්‍රේණිය, තුන් වන වර්ෂයේ දී 8 වැනි ශ්‍රේණිය ආදී වශයෙන් 11 වැ ශ්‍රේණිය දක්වා ශ්‍රේණි සංඛ්‍යාව වැඩි කිරීම සඳහා නැවත නැවතත් අනුමැතිය ලබ ගැනීම අවශ්‍ය නොවේ. එබඳු පාසලක ශ්‍රේණි සංඛ්‍යාව වැඩි කිරීම සඳහා එසේ අනුමැතිය දිය යුතු වන්නේ 6-11 ශ්‍රේණි පරාසයන් සඳහාය.

ii. 1-5 පන්ති පවත්නා ප්‍රාථමික පාසලක 6-11 ශ්‍රේණිවල සිටිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාව එක පන්තියක 10ට වඩා වැඩි වේ නම් අවශ්‍ය භෞතික සම්පත් පවතින විට එහි 6-11 ශ්‍රේණි ආරම්භ කිරීම සඳහා අනුමැතිය දීමට සලකා බැලිය හැකිය. එහෙත් සියුන්ගේ පදිංචි ස්ථානවල සිට කි.මී.4 ක දුරක් තුළ ඉඩ පහසුකම් සහිත 6-11 ශ්‍රේණි පැවැත්වෙන වෙනත් පාසලක් පවතී නම් එසේ නව ද්විතියික පාසලක් ආරම්භ කිරී අවශ්‍ය නොවේ.

**සටහන :-** පාසල්වල ශ්‍රේණි වශයෙන් පන්ති පියවරෙන් පියවර ශ්‍රේණි පරාසය පුළුල් කිරීම අනුබල නොදිය යුතු අතර හැකි සැම විටක ම 1-5 ප්‍රාථමික පාසල් 1-11 කණිෂ්ඨ ද්විතියික පාසල් හෝ 6-13 ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් වශයෙන් පාසල් පද්ධති පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

iii 6 වන ශ්‍රේණිය ආරම්භ කිරීම සඳහා හෝ ද්විතීය චක්‍රය ආරම්භ කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් වූ විට එසේ ශ්‍රේණි ආරම්භ කිරීම සඳහා සාධාරණ අවශ්‍යතාවයක් ඇති බවට ත් 6 වැනි ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ක්‍රමයෙන් පන්ති වැඩි කිරීමට හැකියාවක් ඇති බවට ත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සෑහීමකට පත් විය යුතුය. එබඳු ඉල්ලීමක් නිර්දේශ කිරීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(අ) පාසලේ පිහිටීම.
(ආ) ජ්‍යෙෂ්ඨ ද්විතීයික පන්ති පැවැත්වෙන අනෙකුත් පාසල්වලට දුර
(ඇ) අවට පාසල්වල අදාල පන්තිවල පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව.
(ඈ) සාමාන්‍ය විෂයයන් සහ ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි තාක්ෂණ හා සෞන්දර්යය වැනි විශේෂ විෂයයන් ඉගැන්වීම සඳහා සිටින ගුරු සංඛ්‍යාව
(ඉ) පවත්නා පන්ති කාමර ඉඩකඩ ප්‍රමාණය.
(ඊ) පවත්නා විද්‍යා කාමර/තාක්ෂණික කාමර සංඛ්‍යාව
(උ) ඉහත විෂයයන් ඉගැන්වීම සඳහා පවත්නා උපකරණ පහසුකම්
(ඌ) ප්‍රදේශයේ පවත්නා ප්‍රවාහන පහසුකම් හා ස්වභාවික බාධක (කඳු, ගංගා, වනාන්තර)

iv. පාසල්වල නව ශ්‍රේණි ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ලැබුණු විට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියමිත ආකෘතිය මඟින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඒ පිළිබඳව වාර්තා කළ යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පාසල උසස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ කලාප පාසල් ව්‍යූහ කමිටුවේ නිරීක්ෂණ ද සහිතව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය. පාසල් උසස් කිරීම හැම විටම අධ්‍යාපන අවශ්‍යතා මත පමණක් පදනම් විය යුතුය.

රේඛිය අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලැබෙන අයදුම්පත් අවශ්‍ය කටයුතු සඳහා කලාප අධ්‍යාපන කාර්යාල වෙත යොමු කරනු ඇත.

මෙම සියලු කාර්යයන් කලාප හා පළාත් පාසල් ව්‍යූහ කමිටු වෙත නිර්දේශ සඳහා යොමු විය යුතුය. අවසාන අනුමැතිය අදාළ පළාත් අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කරනු ඇත.

v. යෝජනා අනුමත කිරීම

ජාතික පාසල් උසස් කිරීම සඳහා වන සියලු අයදුම්පත් රේඛිය අමාත්‍යාංශය විසින් අනුමත කළ යුතුය. සෙසු පාසල් සඳහා වන අයදුම්පත් පළාත් අධ්‍යාපන ලේකම්වරුන් විසින් අනුමත කළ යුතුය.

**(ආ) අ.පො.ස. උසස් පෙළ කලා විෂය ධාරාව ආරම්භ කිරීම.**

පොදු කරුණු

පාසල්වල පැවතිය යුතු සංඛ්‍යාවට වඩා අ.පො.ස. උසස් පෙළ කලා පන්ති දැනටම ත් පවතින බව පෙනී යයි. ඉතා සුළු ශිෂ්‍ය සංඛ්‍යාවක් හා ඉතා අඩු මට්ටමේ ගුරු ශිෂ්‍ය අනුපාතයක් මෙම පාසල්වල පැවතීමෙන් මේ තත්ත්වය වඩාත් ඉස්මතු වෙයි. එම නිසා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අ.පො.ස. (උ.පෙ.) කලා විෂයධාරා පන්ති අනුමත කළ යුතු වන්නේ විශේෂ අවස්ථාවල දී පමණි. එබඳු නිර්දේශයක් ඉදිරිපත් කිරීමේ දී අදාළ ප්‍රදේශයේ උසස් පෙළ අධ්‍යාපන පහසුකම් විචාරමත් කිරීමෙන් පසුව වුව ද යෝජිත පන්ති ආරම්භ කිරීම සඳහා ප්‍රබල හේතු ඇති බව ත් ඒවා අධ්‍යාපන හේතු මත පදනම්ව ඇති බව ත් වෙනත් බාහිර හේතූන් සැලකිල්ලට තොගත් බව ත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දැක්විය යුතුය.

අ.පො.ස. (උ.පෙ.) කලා පන්ති ආරම්භ කිරීම සඳහා අනුමැතිය දිය යුතු වන්නේ 11 ශ්‍රේණිය දක්වා පන්ති පවතින පාසලක පමණය.